2014

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම**

**අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2013/14**

**LWU3314 – පරිසර නීතිය**

**කාලය - පැය එකයි.**

Sample

දිනය - 2014 අගෝස්තු 25 වන දින වේලාව - පෙ.ව.10.00 - පෙ.ව.11.00 දක්වා

**අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.**

**එක් ප්‍රශ්නයකට** පමණක් පිළිතුරු සපයන්න.

01. සෙලොනිකා රාජ්‍යය බහුජාතික සමාගමක් සමඟ එහි පළමු න්‍යෂ්ටික බලාගාරය වෙරළ කලාපීය ප්‍රදේශයක් වන සිලැන්ඩි හි ඉදිකිරීම සඳහා වූ ගිවිසුමට අත්සන් තබන ලදී. ව්‍යාපෘතින්හි පාරිසරික ප්‍රශ්නයන් සම්බන්ධයෙන් වන මධ්‍යම සහ ප්‍රධාන රජයේ බලාධිකාරිය වන සෙලොනිකා පාරිසරික සභාව විසින් බල හා බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය ලෙස පත් කරන ලදී.

පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අතර එය ඉංග්‍රීසි පුවත්පත්වල සහ පාරිසරික සභාවේ වෙබ් අඩවියේ පළකරන ලදී. දින 25 ක කාලයක් මහජනතාවට අදහස් දැක්වීම සඳහා ලබා දෙන ලදී. එම කාලසීමාව අවසාන වීමෙන් පසු අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය සඳහා අවසර ලබාදෙන ලදී.

වාර්තාවට අනුව බලාගාරයෙන් සිසිල් කරන ලද ජලය සහ පහළ පෙළේ අපද්‍රව්‍යය මුහුදට මුදා හරිනු ලැබේ. යෝජිත ව්‍යාපෘති භූමියට සැතපුම් 2 කට ආසන්නව කොරල් පරයක් පිහිටා ඇත. එසේම වෙරළ කලාපයේ මෙම කොටසින් නිල් තල්මසුන් හා ඩොල්ෆින් විශාල කණ්ඩායම් හමුවේ. මෙම ව්‍යාපෘතියට කිලෝමීටර 30 ක් අවට ප්‍රදේශයේ ජීවත් වන 25,000 ක් පමණ වන ජනතාව එම ප්‍රදේශයෙන් වෙනත් තැනක නැවත ස්ථාපිත කිරීමට නියමිත වේ. හදිසි අනතුරකින් මුළු රටම විකිරණ සඳහා නිරාවරණය වේය යන බිය මත න්‍යෂ්ටික බලාගාරයට ජනතාවගේ පුළුල් විරෝධතාවයක් මතුව තිබේ. න්‍යෂ්ටික බලාගාරයක් පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව සෙලොනිකා රාජ්‍ය සතුව විශේෂඥ දැනුමක් නොමැති බවට බොහෝ අය තර්ක කරනු ලැබේ.

පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවට අනුව න්‍යෂ්ටික බලය රටේ පවතින බලශක්ති අර්බුදය සඳහා එකම උපාය මාර්ගික විසඳුම බවට හඳුනාගෙන ඇත. බලාගාරය සඳහා පිරිවැය ඇමරිකානු ඩොලර් බිලියන 30.5 ක් බවට සමාගම විසින් තක්සේරු කර ඇති අතර වසර 40 ක කාල පරිච්ඡේදයකදී 40% ක පොලියක් සමඟ නැවත ගෙවිය යුතු ණයක් ලෙස

එම මුදල සෙලොනිකා රාජ්‍යයට ලැබෙනු ඇත. කෙසේ වුවත් පිරිවැය හා ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයක් පරිසර බලපෑම් තක්සේරු වාර්තාවේ අඩංගු වූයේ නැත.

නීති ශිෂ්‍යයාවන් වන ශාන්ති සහ මධුරි විසින් න්‍යෂ්ටික බලාගාරය ඉදි කිරීම අභියෝගයට ලක් කිරීමට අදහස් කරනු ලැබේ. ඔවුන්ට උපදෙස් දෙන්න.

සෙලොනිකා හි නීතිය ලංකාවේ නීතියට සමාන බව දක්වනු ලැබේ.

(ලකුණු 20)

02. පාරිසරික බලපෑම් තක්සේරුව පටන් ගැනීමේදී මූලික අරමුණ වූයේ කර්මාන්ත ශාලා පිහිටවිය යුත්තේ කුමන ස්ථානයන්හිදී ද යන්න තීරණය කිරීම මගින් පරිසර දූෂණය පාලනය කිරීම වේ. එතැන් පටන් එය වඩාත් වැදගත් භූමිකාවක් නිරූපණය කරන ලදී. එකී භූමිකාව විස්තර කළ හැක්කේ " චිරස්ථායී සංවර්ධන මූලධර්මය ක්‍රියාවට නැංවීම උදෙසා, සංවර්ධනයේ තත්ත්වය සහ ස්වභාවික සම්පත් සංරක්ෂණය කෙරෙහි එහි බලපෑම සලකා බැලීමට, තීරණ ගනු ලබන්නන්ට බලපෑම් කිරීමක් ලෙසය..."

Holder, J. (2004). *Environmental Assessment*, Oxford New York at page. 56

ඉහත ප්‍රකාශය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අ. ශ්‍රී ලංකාව වැනි රටවල්හි පරිසර බලපෑම් ක්‍රියාවලිය වැඩිදුරටත් චිරස්ථායී සංවර්ධනය සමඟ ඵලදායී වන්නේ කෙසේ ද?

ආ. චිරස්ථායී සංවර්ධනය සහතික කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ පරිසර බලපෑම් තක්සේරුව පිළිබඳ නීතිය ප්‍රමාණවත් දායකත්වයක් සපයන්නේ යැයි ඔබ සිතන්නෙහි ද? මෙම කාර්යාවලිය වඩාත් ඵලදායී කර ගැනීම උදෙසා කුමන වැඩිදියුණු කිරීම් සහ සංශෝධන ඔබ යෝජනා කරන්නෙහි ද?

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULT Y OF HUMANITIES AND SOCIAL SCIENCES**
**DEPARTMENT OF LEGAL STUDIES**
**LL.B DEGREE PROGRAMME - LEVEL V**
**CONTINUOUS ASSESMENT TEST II - 2013/14**
**ENVIRONMENTAL LAW - LWU3314**

**TIME - ONE HOUR**

---

**DATE – 25th August 2014** **Time – 10.00 a.m – 11.00 a.m**

---

**Illegible handwritings will be penalized.**
**Answer one question only.**

01. The State of Selonica signed an agreement with a multinational company to construct its first nuclear power plant in the coastal area called Zealand. The Ministry of Power and Energy was appointed as a Project Approving Agency by the Selonica Environmental Council which is the central and main government authority on environmental issues, for the project.

An Environmental Impact Assessment (EIA) was prepared in English and it was published in English newspapers and on the web page of the Environmental Council. A period of 25 days was given to the public for comments. After the period ended the Ministry granted approval for the project.

The report stated that the coolant water and low grade waste from the plant will be dumped into the sea. There is a coral reef situated two miles from the proposed location. Large families of blue whales and dolphins are also found off this part of the coast. About 25,000 people who live around 30 km from the project will be relocated from the area. There is widespread opposition to the nuclear power plant as people fear that an accident will expose the whole country to radiation. Many people argue that Selonica does not have the expertise to maintain and operate a nuclear power plant.

According to the EIA report nuclear power was identified as the only possible strategy to solve the country's energy crisis. The cost of the plant was estimated by the company as US$ 30.5 billion, and the money would be loaned to Selonica at 40% interest to be paid over a period of 40 years. However, a cost and benefit analysis was not included in the EIA report.

Shanthi and Maduri, two environmental law students wish to challenge the construction of the nuclear power plant. Advise them. Note that the laws of Selonica are same as the laws of Sri Lanka.

(20 Marks)

02. The original purpose of environmental impact assessment was to control pollution by deciding where a factory should be located. Since then it has taken on a more important role. This role has been described as one "implementing the principle of sustainable development by influencing decision makers to take account of the quality of development and its effects upon the conservation of natural resources..."

Holder, J. (2004). *Environmental Assessment*, Oxford New York *at page . 56*

In the light of this statement answer the following questions.

(a) How does an effective EIA process further sustainable development particularly in a country such as Sri Lanka?

(b) Do you think Sri Lanka's EIA laws are sufficient to contribute towards ensuring sustainable development? What improvements and amendments would you suggest to make this process more effective?

(20 Marks)

*Copyrights Reserved.*